රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 32/2017

මගේ අංකය : EST 5/4/24(XXVII)
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.12.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණ වර්ගීකරණය

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධරයන් හා මාණ්ඩලික නොවන නිලධරයන් පැහැදිලි කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කළ යුතු බවට 2017.12.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කරනු ලැබ ඇත.

02. 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙනුවට 2016.02.23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලද අමාත්‍ය මණ්ඩල අනුමතිය අනුව "රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016" මැයෙන් නිකුත් කළ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

03. උක්ත චක්‍රලේඛයෙහි අංක 11 යටතේ පහත පරිදි රාජ්‍ය සේවයේ තනතුරු/ සේවා වර්ගීකරණයට අදාළ උප වගන්ති ඇතුළත් කර ඇත.

"11.1 රාජ්‍ය සේවයේ තනතුරු/සේවා වර්ගීකරණය උපලේඛන III හි දැක්වේ."

"11.2 මාණ්ඩලික නිලධරයා යන්නට තෘතීය හා ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත්වන තනතුරකට බඳවාගෙන ඇති නිලධරයෙකු අයත් වේ."

"11.3 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී සිටි නිලධරයෙකු තවදුරටත් ඔහුට පමණක් පෞද්ගලික වන සේ මාණ්ඩලික නිලධරයෙකු ලෙස සැලකේ."

04. ඉහත 11.1 උප වගන්තිය පරිදි රාජ්‍ය සේවයේ තනතුරු/සේවා වර්ගීකරණය දැක්වෙන උපලේඛන III හි පහත පරිදි රාජ්‍ය සේවයේ තනතුරු/ සේවා වර්ගීකරණය කර ඇත.

**ප්‍රාථමික මට්ටම**

ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ ශිල්පීය
ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය

**ද්විතීය මට්ටම**

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන
කළමනාකරණ සහකාර - තාක්ෂණික
අධීක්ෂණ කළමනාකරණ සහකාර
ආශ්‍රිත නිලධාරී
ශ්‍රී ලංකා ගුරු සේවය
හෙද සේවය/ වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවයේ සහ අතුරු වෛද්‍ය යන සේවාවන්හි විශේෂ ශ්‍රේණිය හැර එම සේවයෙහි අනෙකුත් තනතුරු පොලිස් සහ අනෙකුත් නියාමන සේවාවන්හි උප පොලිස් පරීක්ෂක සහ ඊට සමාන මට්මට දක්වා වන තනතුරු

**තෘතීය මට්ටම**

ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරීන්
කළමනාකරණ සහකාර - අධි පන්තිය
ශ්‍රී ලංකා විදුහල්පති සේවය
හෙද සේවය/ වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවය සහ අතුරු වෛද්‍ය සේවය යන සේවාවන්හි විශේෂ ශ්‍රේණිය
ලියාපදිංචි/ සහකාර වෛද්‍ය නිලධාරී
පොලිස් සහ අනිකුත් නියාමන සේවාවන්හි පොලිස් පරීක්ෂක/ ප්‍රධාන පොලිස් පරීක්ෂක හා ඊට සමාන මට්ටමේ තනතුරු

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

විධායක
වෛද්‍ය නිලධාරී
ජ්‍යෙෂ්ඨ විධායක/ විශේෂඥ වෛද්‍යවරු
අමාත්‍යාංශ ලේකම් සහ එම වැටුප ලබන වෙනත් තනතුරු
නීති නිලධාරී
අතිරේක සොලිසිටර් ජනරාල්/ නීති කෙටුම්පත් සම්පාදක
සොලිසිටර් ජනරාල්
නීතිපති

05. ඉහත 03හි සඳහන් පරිදි 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි 11.2 හා 11.3 වගන්ති යටතේ සඳහන් නිලධර කාණ්ඩ මාණ්ඩලික නිලධරයන් වන අතර, 11.2 යටතට ගැනෙන නිලධර කාණ්ඩය පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් එම චක්‍රලේඛයෙහි උපලේඛන III හි 3 සහ 4 යටතේ දක්වා ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන III හි 3 සහ 4 යටතට ගැනෙන නිලධරයන් සහ එම චක්‍රලේඛයෙහි 11.3 උප වගන්තියෙහි සඳහන් නිලධරයන් මාණ්ඩලික නිලධර ගණයට අයත් වේ.

06. ඉහත 05හි නිශ්චිතව සඳහන් නොවන කිසියම් තනතුරක් මාණ්ඩලික නිලධර ගණයට අයත් වන්නේ ද යන්න පිළිබඳව ගැටලුවක් ඇත්නම් එය ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එම ගැටලුව සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ද නිරීක්ෂණ ගෙන නිශ්චිත පැහැදිලි කිරීමක් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දෙනු ඇත.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය